වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2025

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 311

5 වන මහල, 1 වන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල

දු.අ.-0112872054/0112887164

ෆැක්ස්- 0112872061/0112872048

ඊ මේල්-info@nppd.gov.lk

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

අන්තර්ගතය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

03 පරිච්ඡේදය- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 1

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක 23

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය 19

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 1

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 26

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඉන් අනතුරුව ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැඳගත් තිරසර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය මතුවූ බැවින්, ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම අරමුණු කරගෙන 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින්2000 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව බවට ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මසැකසීමෙන් අනතුරුව ඊට අනුගත වන ලෙස ශ්‍රී ලංකාවේ පළාත් නවය සඳහා වෙන වෙනම ඒ ඒ පළාතේ ගැටළු හඳුනා ගනිමින් ද පවතින සම්පත් උපරිමව උපයෝගී කරගනිමින් ද තිරසාර සංවර්ධනයක් උදෙසා මාර්ගෝපදේශයක් ලබා දීමට කලාපීය භෞතික සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් ඵලදායී ලෙස භාවිත කරමින් ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින් ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම්වලින් යුතු නගර හා සේවා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීමසිදු කරයි.

ඊට අමතරව ලංකාවේ ප්‍රධාන පූජාභූමිවල විධිමත් සංවර්ධනය උදෙසා වින්‍යාස සැලසුම් සැකසීමත්, ඊට අනුරූපීව ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම, එම ව්‍යාපෘති සඳහා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර දීමත් සිදු කරමින් ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනරුදය සඳහා ද විශාල දායකත්වයක් ලබා දේ.

ඉහත සඳහන් කර්තව්‍යයන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයට ඉටු කළ සහ ඉටුකරමින් සිටින මෙහෙවර අතිමහත්ය.

මෙම කර්තව්‍යයන් සාර්ථකව ඉටු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන කලාපීය භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය, ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යාත්මක අංශය යන අංශ සාමුහිකව කැප වේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු”

මෙහෙවර

1. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සකස්කිරීම
2. ශ්‍රී ලංකාවේ ඉඩම්වල ආර්ථික, සාමාජීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම් කිරීම ප්‍රවර්ධනය සහ නියාමනය අරමුණු කරගෙන ජාතික භෞතික සැලැස්මක් සකස් කිරීම
3. කලාපීය සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් මගින් එම ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ ජාතික භෞතික සැලැස්ම ක්‍රියාවට නැංවීම
4. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික සැලසුම් බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් නියමු උපදෙස් සකස් කිරීම.
5. ස්වාභාවික පහසුකම් අරක්ෂා කිරීම, ස්වාභාවික පරිසරය, ගෘහ නිර්මාණමය සහ ඓතිහාසික වශයෙන් වැදගත් ගොඩනැගිලි සහ ස්වාභාවික ලෙස විසිතුරු ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම

අරමුණු

1. ශ්‍රී ලංකාවේ සැලසුම්ගත තිරසාර හා සොඳුරු භෞතික සංවර්ධනයක් අරමුණු කරගෙන, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම නිර්මාණය කිරීම.
2. ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සමාජයීය, භෞතික හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම්කරණයක යෙදීම.
3. භෞතික සංවර්ධනයන් සැලසුම් කිරීම සඳහා ඕනෑම ආයතනයකට හෝ සංවිධානයකට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විශ්වාසනීය හා ඵලදායී සේවාවක් ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවේ ධාරිතාවය සංවර්ධනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

i. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියක් සකස් කිරීම
ii. ජාතික භෞතික සැලැස්මක් පිළියෙල කිරීම

iii. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික නිර්මාණ නියමු උපදෙස් සකස් කිරීම.

iv. කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික නිර්මාණ බලධරයාට යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වූ අවස්ථාවක හෝ එවැනි සැලැස්මක් පිළියෙල කරන ලෙස ඒ බලධරයා විසින් ඉල්ලා සිටි විට එවැනි යම් කලාපීය හෝ ප්‍රාදේශීය සැලැස්මක් පිළියෙල කිරීම.

v. කලාපීය භෞතික සැලසුම් පිළියෙල කිරීමේ දී සහ සංවර්ධනය කිරීමේ දී පළාත් සභාවලට සහාය වීම.


vi. ජාතික භෞතික නිර්මාණ සභාව වෙත ඉදිරිපත් කිරීම පිණිස, ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තියට අනුකූලව අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

vii. ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තිය, ජාතික භෞතික සැලැස්ම සහ ක්‍රියාත්මකව පවතිමින් තිබෙන ජාතික භෞතික සැලසුම් ක්‍රමෝපාය වරින් වර සමාලෝචනය කිරීම සහ පරීක්ෂා කර බැලීම සහ අවශ්‍ය වූ අවස්ථාවක, ඒ ප්‍රතිපත්තියක්, සැලැස්මේ ක්‍රමෝපාය වල වෙනස්කම් සම්බන්ධීකරණ කමිටුව වෙත නිර්දේශ කිරීම.

viii. ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමැතිය දී ඇති ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක වීම නියාමනය කිරීම.

ix. ජාතික භෞතික නිර්මාණ සභාව සහ අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින්, ඉටුකරන ලෙස ඉල්ලා සිටිනු ලැබිය හැකි ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටු කිරීම ද ඇතුලුව, සභාවේ සහ සම්බන්ධීකරණ කමිටුවේ සියලු ක්‍රියාකාරකම්වලදී සභාවට සහ සම්බන්ධීකරණ කමිටුවට සහාය වීම.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
සංවිධාන සටහන



1.4 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන අංශවලින් සමන්විතය.

1. කලාපීය භෞතික සැලසුම් අංශය
2. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය
3. පර්යේෂණ අංශය
4. සම්බන්ධීකරණ හා නියාමනඅංශය
5. වාස්තු විද්‍යා අංශය
6. ඉංජිනේරු අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය


1.5 2025 වසරේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය මගින් ලැබුණි

02.පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2025 වසරේදී පහත සඳහන් කටයුතු සාර්ථකව නිම කරන ලදි.

1.ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනතට අනුකූලව යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම-2050 2025 වසරේදී භෞතික සැලසුම් විශයභාර ඇමතිතුමාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වර්තමාන ජනාධිපතිතුමාට ඉදිරිපත්කර අදහස් ලබාගන්නා ලදී. මෙම සැලැස්ම සඳහා කමිටුවක් පත්කර අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඉදිරිකටයුතු සිදුකරන ලෙස දන්වන ලදී.

The Proposed Spatial Structure - 2050



2. 2000 අංක 49 පනතින් සංශෝධිත 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ සැලසුම් ආඥාපනතේ 5(ඒ), (බී)සහ 5(සී)වගන්තියේ විධිවිධාන අනුව ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව අයත් වන විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශ සඳහා කලාපීකරණ සැලසුම් සකස් කල යුතුය. ඒ අනුව 2025 වසරේදී නැගෙනහිර හා මධ්‍යම පළාත් සඳහා කලාපීකරණ සැලසුම් සකස් කරන ලදි. එහිදී, එක් එක් කලාපීකරණ සැලසුම් සඳහා 2025 වර්ෂයේ දී සිදු කරන ලද කටයුතු පහත සඳහන් වේ.

මධ්‍යම පළාත

මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්මසකස්කිරීමට අදාළවඅංශික සංවර්ධන උපාය මාර්ග (Sectoral Development Strategies) සකස්කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති (Action Projects) හඳුනාගැනීම අවසන් කර මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම, II කොටස (Central Province Regional Physical Plan – 2035,Volume II) වාර්තාව සකස් කිරීමේ කටයුතු නිම කිරීම.

නැගෙනහිරපළාත

නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම - 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) වාර්තාව සකස්කර එය අනුමත කිරීමේ ක්‍රියාපටිපාටියේ එක් පියවරක් වන තාක්ෂණ ඇගයීම් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එහිදී ලබාදුන් උපදෙස් අනුව නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

2025 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද ආගමික ස්ථාන පහත සඳහන් වේ.

4.අනුරාධපුර ඇතුළුනුවර පුරා විද්‍යා රක්ෂිත තුල පදිංචිකරුවන් එම ප්‍රදේශයෙන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කර ඇතුළුනුවර පුරාවිද්‍යා සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම මගින් ඇතුළුනුවර ප්‍රදේශයේ පුරාවිද්‍යා කැණීම් සිදුකිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරගෙන අනුරාධපුර ලෝලුගස්වැව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

1. අනුරාධපුර ඇතුළුනුවර පදිංකරුවන් පිළිබඳව නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා උපදේශක කන්ඩායම ලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය තෝරා ගන්නා ලදී
2. 2025 දෙසැම්බර් වන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නැවත පදිංචිකිරීමේ ක්‍රියාවලියට අදාලව කොන්ත්‍රාත් ගිවිසුම අනුව බාරදිය යුතු වාර්තා 5ක් බාරදෙන ලදී.

5.2000 අංක 49 දරණ පනතින් සංශෝධිත 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ 6(2)b හා 21(2) වගන්ති යටතේ **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට ලැබී ඇති බලතල අනුව බුද්ධ ශාසන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබෙන ඉල්ලීම ද සලකා බලමින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද නිර්ණායක සපුරනු ලබන ආගමික සිද්ධස්ථාන පමණක්** පූජාභූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබයි. ඒ අනුව 2025 වර්ෂය දක්වා ගැසට් මගින් ප්‍රකාශයට පත්කරනලද මුළු ආගමික ස්ථාන ප්‍රමාණය 147කි. 2025 වර්ෂයේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද පූජාභූමි පහත සඳහන් වේ.

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	ආගමික ස්ථානයේ නම	ගැසට් කරන ලද දිනය	ගැසට් අංකය
01	බස්නාහිර	ගම්පහ	දඩගමුව සුමිත්ත ශ්‍රී සුන්දරාරාමය	2025.04.25	2433/30
02	මධ්‍යම	නුවරඑළිය	කොත්මලේ මලියදේව රජමහා විහාරය	2025.05.08	2435/06
03	දකුණු	හම්බන්තොට	සීගල රජමහා විහාරය	2025.05.23	2437/47
04	බස්නාහිර	ගම්පහ	අස්ගිරිය රජමහා විහාරය	2025.05.23	2437/49
05	වයඹ	කුරුණෑගල	ගණේගොඩ මණ්ඩලාරාම පුරාණ විහාරය	2025.05.23	2437/50
06	බස්නාහිර	කළුතර	වරකාගොඩ ගල්ලෙන රජමහා විහාරය	2025.05.23	2437/52
07	දකුණු	ගාල්ල	ඇත්කඳ පුරාණ රජමහා විහාරය	2025.06.21	2441/57
08		මාතර	දීඝවාළුකාරාම රජ මහා විහාරය	2025.06.21	2441/58
09			මහාමන්තින්න රජමහා විහාරය	2025.06.21	2441/59
10			කප්පින්න මහා විහාරය	2025.06.30	2441/60
11	බස්නාහිර	කොළඹ	සංඛපිටිටි රජමහා විහාරය	2025.06.30	2443/10
12			වීදියගොඩ රජමහා විහාරය	2025.05.23	2437/51
13	දකුණු	හම්බන්තොට	කොන්දගල රජමහා විහාරය	2025.05.23	2437/48
14	වයඹ	කුරුණෑගල	රම්බඩගල්ල පුරාණ රජමහා විහාරය	2025.08.13	2449/26
15	දකුණ	ගාල්ල	කච්චිවත්ත පුරාණ විහාරය(දීපදුත්තාරාමය)	2025.09.10	22/2453

නාගරික සංවර්ධන ප්‍රදේශ,රජයේ ආයතන, ආගමික ස්ථාන සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම

අංකය	ස්ථානයේ නම	ව්‍යාපෘතිය
01	අනුරාධපුර පූජාභූමිය	යෝජිත ලෝවාමහාපාය පෝයගේ ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම
02		යෝජිත රුවන්වැලිසෑය අසපුව ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම
03		අභයගිරිය රථගාලේ විවේකී ස්ථානය ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම
04		මිරිසවැටිය පූජාභූමිය සඳහා යෝජිත ජල පෙරනය ඉදිකිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම
06	කතරගම පූජාභූමිය	කිරිවෙහෙර හා දේවාලය අතර පවතින මල්කඩ 20 අලුතින් ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කිරීම
07		අලි ඇතුන් සඳහා නාන තටාකයක් ඉදි කර දීම සහ ඇත්ගාල සංවර්ධනය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම
		වනජීවී කපොල්ල අසල රථගාල සඳහා සැලැස්මක් සැකසීම
08	සේරුවාවිල මංගල රජමහා විහාරය	යෝජිත පූජාවටිටි සකස් කිරීමේ ස්ථානය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම

2.ඉදිරි ඉලක්ක

2026 වසරේ දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන කටයුතු.

1.මෙම වාර්තාවේ විශේෂ ජයග්‍රහණ යටතේ අංක 1 න් දක්වා ඇති පරිදි යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම 2050 සඳහා

1.කැබිනට් අනුමැතිය ලබා ගැනීම

2.ඉන්අනතුරුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

3. ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

4.අදාල පාර්ශවකරුවන් දැනුවත්කිරීම, 2026 වසර තුළදී සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2.සීඝ්‍රයෙන් අවධිමත් ලෙස සංවර්ධනය වන ජනාවාස සැලකිල්ලට ගෙන විධිමත් සංවර්ධනයකට මාර්ගෝපදේශ ලබාදීම සඳහා නැගෙනහිර හා මධ්‍යම පළාත් දෙක සඳහා කලාපීය සැලසුම් සකස් කරමින් පවතින අතර 2026 වර්ෂයේදී

- මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම සකස්කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිම කිරීමට නියමිතය.
  - මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035 (දළ සැලැස්ම) මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලසුම් කමිටුව සහ තාක්ෂණ උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කිරීම
  - පනතේ විධිවිධාන පරිදි, අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම
  - මධ්‍යම පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, II කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

- නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම -2035 11කොටස (Eastern Province Regional Physical Plan –2035,Volume II) සකස්කිරීමට අදාලව පහත සඳහන් කාර්යයන් නිමකිරීමට නියමිතය.

-පනතේ විධිවිධාන පරිදි අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව සහ ජාතික භෞතික නිර්මාණ සභාව යන කමිටු වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතියන් ලබාගැනීම

-නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලැස්ම-2035, 11කොටස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීම

4.අනුරාධපුර, ඇතුල් නුවර පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශය තුළ පදිංචිකරුවන් ක්‍රමානුකූලව පුනස්ථාපනය කිරීම සඳහා ලෝලුගස්වැව නගර සංවර්ධන වැඩසටහනක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, 2025 වර්ෂයේ දී එම ව්‍යාපෘතියේ ඇතුල්නුවර පදිංචිකරුවන් පුනස්ථාපනය කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට බලාපොරොත්තු වේ.

1. නැවත පදිංචිකිරීමේ සැලැස්මේ අවසන් වාර්තාව ඇතුළු වාර්තා තුනක් 2026.01.19 වන විට භාරදිය යුතුව ඇත.

5.2026 වසරේදී ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට යෝජිත පූජා භූමි

දිස්ත්‍රික්කය	ආගමික ස්ථානයේ නම
කුරුණෑගල	වතුකන ශ්‍රී ශෛලගිරි රජමහා විහාරය
	ශ්‍රී බෝධිවංශාරාම විහාරය
	ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරය
	ගණේගොඩ මණ්ඩලාරාම පුරාණ විහාරය
	යක්ගිරිලෙන් රජමහා විහාරය
	නාගොල්ල රජමහා විහාරය
	රැස්වෙහෙර පුරාණ විහාරය
	ගනේකන්ද මණ්ඩලාරාම විහාරය
	ඓතිහාසික වනමන්දාව වනවාසි රජමහා විහාරය
පුත්තලම	ඇතුබැදි කදුරුකොට්ටේ පුරාණ රජමහා විහාරය
	පුරාණ ළිහිණිගිරි රාජමහා විහාරය
	ශ්‍රීසන්දනම් පොකුණ
	මුල්ගිරිල විහාරය
	මුරුක්කුටුවන ගල්ලෙන් රජමහා විහාරය
	නන්දිමිත්‍ර නවවංගු විහාරය
	පෙත්තිගම රජමහා විහාරය
	සිරි දෙව්රම් වෙහෙර රජමහා විහාරය
ගාල්ල	වැලිපිටිමෝදර ශ්‍රී ථූපාරාම රජමහා විහාරය
	කුලීගොඩ පුරාණ වන වාසල රජමහා විහාරය
	ශ්‍රී සුමනාරාම පුරාණ විහාරය
	දොඩන්දුව ඓතිහාසික කුමාරමහා විහාරය
	ශ්‍රී ජයවර්ධනාරාම විහාරය
	බලපිටියේ සුභද්‍රාමය රජමහා විහාරය
මාතර	ශ්‍රී රෝහණ උපෝසථාගාර මහා විහාරය
	පනන්වල ගනේගොඩ පුරාණ විහාරය
	වැවුරුකන්නල රජ මහා විහාරය
	වෙළුවනාරාම මූලමහා විහාරය
	කොට්ටෙගොඩ සුදර්ශන බිම්බ මහාවිහාරය
	වෙහෙරගම්පිට රජමහා විහාරය
	සබරලේ ශ්‍රී නිවාසාරාම පුරාණ විහාරය
	ශ්‍රී පූර්වාරාම පුරාණ විහාරය
හම්බන්තොට	**රම්ඹා රජ මහා විහාරය**
	ගල්ගොඩකන්ද මිණි කිරුළ රජ මහා විහාරය
	නාමළුව රජමහා විහාරය
කොළඹ	රත්මලාන පුෂ්පාරාමය
	කොරතොට රජමහා විහාරය
	කොස්ගම ලෙනවර රජමහා විහාරය
	පිළියන්දල මඩපාත ශෛලතරාම විහාරය
කළුතර	පාහියංගල රජමහා විහාරය
	මඳුරාවල බැල්ලපිටිය විද්‍යාසේකර පිරිවෙන

	පැලෑද ගල්කණුගොඩැල්ලේ රජමහා විහාරය
ගම්පහ	හෙයියන්තුඩුව පුරාණ විහාරය
	හෙයියන්තුඩුව පුරාණ විහාර
	සමනබැද්ද රජමහා විහාරය
	සපුගස්කන්ද පුරාණ විහාරය
අම්පාර	මුවන්ගල රජමහා විහාරය
	ඓතිහාසික දීඝවාලිය පරිවාර චෛත්‍ය රජමහා විහාරය
ත්‍රිකුණාමලය	පත්මරාජ පබ්බත වන සෙනසුන
	සිරි ගජබා ගල්ලෙන් විහාරය
මන්නාරම	මාතොට රජමහා විහාරය
පොලොන්නරුව	සෝමාවතිය රජමහා විහාරය
	කන්දේගම ධනංජය රජමහා විහාරය
	බුදුරුවයාය රජමහා විහාරය
	කන්දේගම ධනංජය විහාරය
අනුරාධපුර	කොස්සෝකන්ද කසාගල පුරාණ රජමහා විහාරය
	කන්දේගම නාමඵව සිංහගිරි රජමහා විහාරය
	මහකනදරාව තපෝවනය(ගලේපන්සල)
	මකුලෑව ශ්‍රී සුදර්ශන පුරාණ විහාරය
	රුනෑකන්ද රජමහා විහාරය
	අවුකන රජමහා විහාරය
	ශ්‍රී ධාතුසේන රජමහා විහාරය
	කිණිහිරිකන්ද රජමහා විහාරය
මුලතිව්	ශ්‍රී උදුම්බරා රජමහා විහාරය
නුවරඑළිය	යතුරුගැහු ලියද්ද රජමහා විහාරය
	මාදන්වල රජමහා විහාරය
	හඟුරන්කෙත වැගම රජමහා විහාරය
මාතලේ	ශ්‍රී රජමහ කොහොන් විහාරය
	ඓතිහාසික සොනුත්තර රජමහා විහාරය
	ශ්‍රී විජය සුන්දර මන්තින්දාරාම පුරාණ විහාරය
මහනුවර	ඓතිහාසික සගම රජමහා විහාරය
රත්නපුරය	ගොඩකවෙල ශ්‍රී මහින්ද මහා විහාරය
	මානියම්ගම රජමහා විහාරය
	අම්මඩුව කුඩා කතරගමදේවාලය
කෑගල්ල	ශ්‍රී අරහත්ත මලියදේව රජමහා විහාරය

නාගරික සංවර්ධන ප්‍රදේශ,රජයේ ආයතන, ආගමික ස්ථාන සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දීම

ස්ථානයේ නම	ව්‍යාපෘතිය
දිඹුලාගල ආරණ්‍ය සේනාසනය	පැරණි ලෙන් විහාරය ප්‍රතිසංස්කරණය කිරීම
මාම්පිට වලගම්බා රජමහා විහාරය	දාන පිළියෙල කිරීමේ ශාලාව සැලසුම් සකස් කිරීම
	සංවර්ධන සැලැස්ම සකස් කිරීම
අනුරාධපුර පුජාභූමිය	වාහල්කඩ ඉදිකිරීම
	අභයගිරි රථගාල ඉදිකිරීම
	මල්කඩ ඉදිකිරීම

කතරගම පූජාභූමිය	මල්කඩ ඉදිකිරීම
	පළතුරු වට්ටි සකස් කිරීම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කර දේවාලයට භාරදීම
	බැතිමතුන්ගේ පාවහන් තැබීම සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීමට සැලසුම් සකස් කර දේවාලයට භාරදීම
	කතරගම පූජාභූමියේ සේවය කරනු ලබන පොලිස් නිළධාරීන් සඳහා විවේක ගැනීමේ ස්ථානයක් ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කර දේවාලයට භාරදීම

මීට අමතරව වෙනත් ආයතන සහ පූජනීය ස්ථානවලින් කෙරෙන ඉල්ලීම් අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වාස්තු විද්‍යාත්මක සැලසුම්, ව්‍යුහාත්මක සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කර දීමට බලාපොරොත්තු වේ.


ඩබ්.ටී.එච්.රුවිර විතාන

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

03 පරිච්ඡේදය- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය



එසිස්-එස්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	තක්ෂ 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අලුම්		199,065,000	182,029,000	එසිස්-3
-	තැන්පතු		285,904	298,114	එසිස්-4
-	අක්තිකාරම් ගිණුම්		8,836,565	11,007,181	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		208,187,469	193,334,295	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		208,187,469	193,334,295	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ඉදිරි ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		208,187,469	193,334,295	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
145,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	124,226,167	117,459,357	එසිස්-2(ii)
74,950,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	59,865,680	63,018,134	
1,050,000	සභානාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	50,000	34,133	
-	පොළී ගෙවීම්	8	389,480	495,464	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
221,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		184,531,327	181,007,088	
	මූලධන වියදම්				
10,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	6,159,523	5,689,204	එසිස්-2(ii)
2,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,433,868	1,142,819	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	තැකියා වර්ධනය	14	706,500	898,473	
30,000,000	වෙනත් මූලධන වියදම්	15	7,123,538	585,125	
43,000,000	මුළු මූලධන වියදම් (උ)		16,423,429	8,315,621	
	තැන්පතු ගෙවීම්		269,051	170,948	එසිස්-4
	අක්තිකාරම් ගෙවීම්		14,802,632	10,476,584	එසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		15,071,683	10,647,532	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		216,026,439	199,970,241	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(7,838,970)	(6,635,946)	
	අලුම් ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(7,838,970)	(6,635,946)	එසිස්-7
	දෙසැම්බර් 31 දිනට අලුම් ශේෂය		-	-	එසිස්-3

1

ඒඑසී-සී

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	නත්‍ය	
		2025	2024
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	272,873,245	270,795,849
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	28,394,049	22,427,982
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		301,267,294	293,223,831
ඉද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉද්ධ වත්කම්		28,167,787	22,218,573
දේපළ පිරියත හා උපකරණ සංචිතය		272,873,245	270,795,849
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ප්‍රගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	226,262	209,409
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		301,267,294	293,223,831

පිටු අංක 21 සිට 27 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 28 සිට 46 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්මෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුම්මෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඝට්ලතාවය් අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක නිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2026-02-26	දිනය : 2026.02.26	දිනය : 2026.02.25
පේජෂ්ඨ මහාචාර්ය ඒ.ඒ.ඩී.ඒ. පෙරේරා	ඩබ්.ඒ.එම්. රාජිත ප්‍රනාන්දු	වාමිනී ජයසිංහ
ප්‍රවාහන, මහාමාර්ග සහ ගාමීය සංවර්ධන අමාත්‍යාංශය		ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
7 වන මහල, සෙත්සිරිපාය (අදියර II)		1 අදියර - 5 වන මහල, "සී"
		සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ඒසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	නම්‍ය	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුල් බදු ලැබීම්	-	-
භාණ්ඩ, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	10,009,330	9,128,429
අනුමත ලැබීම්	199,065,000	182,029,000
අත්තිකාරම් අයකර ගැනීම්	7,928,580	11,172,739
තැන්පතු ලැබීම්	285,904	298,114
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	217,288,814	202,628,282
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුදුසු පඩිනඩි හා මෙහෙයුම් වියදම්	183,819,815	180,863,304
සභාධාර සහ මාරුකිරීම්	439,480	34,133
මූලධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	13,989,561	7,172,802
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	1,771,508	2,767,692
භාණ්ඩාගාරයට පියවන ලද අනුමත	-	
අත්තිකාරම් ගෙවීම්	14,565,531	10,476,584
තැන්පතු ගෙවීම්	269,051	170,948
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	214,854,946	201,485,463
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	2,433,868	1,142,819
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ණිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා මෙහෙයික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	2,433,868	1,142,819
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	2,433,868	1,142,819
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(2,433,868)	(1,142,819)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වාර්තාකිරීමේ පදනම්

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම්**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ළඟා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආක්‍රමණිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම්" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

- සම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම් යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	**වෙන් කරන ලද ප්‍රතිපාදන**		**තත්‍ය වියදම**	**උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස**
	මුදල් ප්‍රතිපාදන	**අවසාන ප්‍රතිපාදන**		
පුනරාවර්තන	221,000,000.00	219,693,200.00	184,514,527.00	91%
ප්‍රාග්ධන	43,000,000.00	44,306,800.00	16,423,429.00	21%


3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන - නොමැත

අනු අංකය	**ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව**	**ප්‍රතිපාදනයේ අරමුණ**	**ප්‍රතිපාදන**		**තත්‍ය වියදම**	**උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස**
			මුල් ප්‍රතිපාදන	**අවසාන ප්‍රතිපාදන**		
-	-	-	-	-	-	-

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	**කේත විස්තරය**	**2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය**	**2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය**	**ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත**	**ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම**
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	81,400,000.00	-	
9152	යන්ත්‍රෝපකරණ	-	108,932,844.91	-	
9153	ඉඩම්	-	82,150,000.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	390,400.00	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.7 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/E/2025/NPPD/FA/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 මැයි 18 දින

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශීර්ෂය 311 - ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු නිඛේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක SA/GFS/01/01/11/311 හා 2025 නොවැම්බර් 20 දිනැති ලිපිය අනුව මෙම දෙපාර්තමේන්තුවට අයත් මුතියංගනය ව්‍යාපෘති	වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය.	රජයේ ස්ථාවර වත්කම් තක්සේරු කිරීම යටතේ මෙම දෙපාර්තමේන්තුව විසින් භුක්ති විඳිනු ලබන මුතියංගනය විශ්‍රාම ශාලාව සහ ව්‍යාපෘති කාර්යාලය වැරදි සහගත ලෙස මුතියංගන සංචාරක බංගලාව සහ ව්‍යාපෘති කාර්යාලය වශයෙන් සටහන්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කාර්යාලය සහ සංචාරක බංගලාවට අදාළ රු. 31,000,000 ක් වූ ගොඩනැගිලි තක්සේරු වටිනාකම් සිගාස් පද්ධතිය		කර ඇති බැවින් ද, තක්සේරු වාර්තාවේ පදනම් වර්ෂය 2013 ලෙස ඇතුළත්ව ඇති බැවින් එම තක්සේරුව ඇතුළත් නොකරන ලද අතර 2026 පදනම් වර්ෂය
හරහා ගිණුම්ගත කරන ලෙස දැනුම් දී තිබුණද එම වටිනාකම් ඒ අනුව මූල්ය ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකමට ඇතුලත් කර නොතිබුණි.		සඳහා 2026 මාර්තු 31 දිනැනිව මුතියංගනය විශ්‍රාම ශාලා ගොඩනැගිල්ල සහ ව්‍යාපෘති කාර්යාල ගොඩනැගිල්ල ලෙස නිවැරදිව සටහන් කර එවන ලද තක්සේරුව CIGAS වැඩසටහන සඳහා ඇතුළත් කිරීමට දැනටමත් කටයුතු කරමින් ඇත.

(ආ) මූලධන වියදම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මූලධන වැය විෂය අංක 311-1-1-1-2506 යටතල පහසුකම් සංවර්ධනය යටතේ ජාතික සැලැස්ම සඳහා වෙන්කල රු.5,000,000 ක මුදලින් සියයට 93 ක් හා මූලධන වැය විෂය අංක 311-1-1-2-2506 යටතේ ලෝලුගස්වැව ව්‍යාපෘතිය සඳහා වෙන්කල රු.25,000,000 ක මුදලින් සියයට 73 ක්ම සංවර්ධන කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට සෘජුවම හේතු වී තිබුණි.	නිසි සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන්කර ගනිමින් අයවැය ප්‍රතිපාදන උපරිමයෙන් උපයෝජනය කල යුතුය.	2025 වර්ෂයේ දී වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් ලෝලුගස්වැව නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට උපදේශක ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය 2025 මැයි 20 දින තෝරා ගැනීම සිදුකර ඇත. නමුත් ඇතුලු තුවර පදිංචිකරුවන්ගේ බලවත් විරෝධය නිසා නියමිත කාලය තුල සමාජ සමීක්ෂණය සිදුකිරීමට නොහැකි විය. එබැවින් 2025 වසරේ එම ව්‍යාපෘතිය සඳහා වෙන්වූ මුදල් වියදම් කිරීමට නොහැකි විය.

(ඇ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුව සතුව භාවිතයෙහි ඉඩම් 17 ක් හා ගොඩනැගිලි 18 ක් පැවතියද, තක්සේරු කර වටිනාකමක් හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කර තිබුණේ ඉඩම් 8 හා ගොඩනැගිලි 11 ක් පමණි. එමෙන්ම ඉන් ඉඩම් 11 ක් සඳහා හිමිකම් ඔප්පු ලබාගැනීමට මෙවන තෙක්ම කටයුතු කර නොතිබුණි.	භාවිතයෙහි පවත්නා ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් හිමිකම් ඔප්පු ලබා ගැනීමටත් කටයුතු කල යුතුය.	අංක 2/2019 හා 2019 ජුනි 04 දිනැති චක්කම් කළමනාකරණ චක්‍රලේඛය මගින් අංක 4/2018 දරන 2018 දෙසැම්බර් 31 දිනැති චක්‍රලේඛයේ 03 හා 04 වන ඡේද ඉවත්කර ඇති බැවින්, ඒ අනුව කටයුතු කල යුතුව ඇත. ඉඩම් 11 සඳහා හිමිකම් ඔප්පු ලබා ගැනීමේ පියවර ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් කොමසාරිස් ජනරාල් අතර පවතින සම්බන්ධීකරණ වැඩ පිලිවෙළක් බැවින් අදාල කාර්යාලද සම්බන්ධ කර ගනිමින් හිමිකම් ඔප්පු මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 262/2017 හා 2017 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂයෙන් පසු විශ්‍රාම හෝ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය මුදලක් අත්තිකාරම් ලබ	චක්‍රලේඛ ප්‍රකාරව විශ්‍රාම ගෙන හෝ මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගත යුතුය.	විශ්‍රාම ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ ණය ශේෂයන් පියවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී නොමැති අතර 2025 වර්ෂයේ දෙසැම්බර් මස මියගිය නිලධාරියාගේ මරණ පාරිතෝෂිතය මෙතෙක් ලැබී නොමැත. ඉදිරියේ දී මෙම නිලධාරියාගේ ණය ශේෂ පියවීමට කටයුතු කරනු ලැබේ.

ගිණුමෙහි නොදැක්වීමට ආයතන ප්‍රධානීන් වගබලාගත යුතු වුවත් දෙපාර්තමේන්තුවේ මීයගිය සහ විශ්‍රාමික නිලධාරීන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 816,509 ක මුදලක් අයකර නොගෙන අත්හිටුවා තිබුණි.	

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 හි 08 වන ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සිගාස් පද්ධතිය තුල පවත්වා ගත යුතු ස්ථාවර වත්කම් මොඩියුලය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි රු. 272,873,245 ක් වටිනා මූල්‍ය නොවන වත්කම්හි නිරවද්‍යතාවය තහවුරු කල නොහැකි විය.	වැකුලේඛ ප්‍රකාරව සිගාස් පද්ධතියෙහි ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් නියමිත වටිනාකම් හඳුනාගනිමින් ගැලපීම් කර එහි යොදාගන්නා කේතාංක අදාල වත්කමෙහිද අලවා යාවත්කාලීනව පවත්වා ගත යුතුය.	Cigas පද්ධතිය තුල මූල්‍ය නොවන වත්කම් මොඩියුලය පහත පරිදි වේ. ඉඩම් - රු. 82,150,000.00 ගොඩනැගිලි-රු 81,400,000.00 යන්ත්‍ර හා උපකරණ-රු. 108,932,844.91 අස්පෘශ්‍ය වත්කම් රු. 390,400.00 මුළු එකතුව-රු. 272,873,244.91 ඒ අනුව, Cigas පද්ධතිය තුල මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි යාවත්කාලීන කර ඇති අතර, මූල්‍ය ප්‍රකාශන හා Cigas පද්ධතිය තුල වත්කම්වල එකතුවට නිවැරදිව සමාන වේ.

(ඊ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම
විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවක්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇතත්, සමහර විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීමේ දී මාස 1-3 ත් අතර කාලයක් ගත වී ඇත. ඉදිරියේ දී නියමිත කාල පරාසය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට සටහන් කර ගනිමි.

(උ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	විගණන නිරීක්ෂණය		නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම		
(i)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය මූදල් රෙගුලාසි අංක 1645.	පවත්වා ගතයුතු ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.	මූදල් රෙගුලාසි ප්‍රකාරව ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගත යුතුය.	ඉදිරිපත් කර ඇති කරුණු වලට අදාලව මේ දක්වා ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. යාවත්කාලීන කර නොමැක්කේ කුමන ලොග් සටහන් පොතද යන්න නිවැරදිව සටහන් කර නොමැති බැවින්, කරුණට පැහැදිලිව පිළිතුරක් ලබාදිය නොහැක.
(ii)	භාණ්ඩාගාර ලේකම්ගේ 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	චක්‍රලේඛයට අනුව වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම්	චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කල යුතුය.	මුතියංගන සංචාරක බංගලාවේ තක්සේරු වාර්තාව ලැබී තිබුණ ද, එය දෝෂ සහගත බැවින්, කොම්ප්ට්‍රොලර් ජනරාල්

		ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රොලර් ජනරාල්ට යැවිය යුතු යාවත්කාලීන කොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.		වෙත ඉදිරිපත් නොකරන ලදී. 2026 වර්ෂයේ දී එය නිවැරදි කර වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කරනු ලැබේ.
(iii)	2024 දෙසැම්බර් 18 දිනැති මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක 2024/05 දරන වත්කම් කළමනාකරණ වක්‍රලේඛයේ 02 (i)(අ) සහ 04(i)(ii) ඡේද	වක්‍රලේඛය ප්‍රකාරව අධිකාරිය සතුව භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන වාහන 05 ක් අපහරණය කිරීමටත්, අපහරණය සම්බන්ධ කොරතුරු රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) හි වාර්තා කිරීමටත් මෙවන තෙක්ම කටයුතු කර නොතිබුණි.	වක්‍රලේඛ ප්‍රකාරව වාහන අපහරණය කල යුතුය.	මෙම වාහන අපහරණය කිරීම සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීමට වාහන අපහරණ සමාලෝචන කමිටුවට ඉදිරිපත් කර ඇත. එම වාර්තාව ලද වහාම ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
පොළොන්නරුව පුලතිසිපුර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීම වෙනුවෙන් වසර 3 – 5 අතර කාලයක සිට ජනාධිපති කාර්යාලයෙන්, දෙපාර්තමේන්තුවට රු. 340,200 ක් අය විය යුතු වුවද එම මුදල අය කර ගෙන නොතිබුණි.	හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කල යුතුය.	ජනාධිපති ලේකම් කාර්යාලය සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වෙමින් අයකර ගත යුතු හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මෙතෙක් ජනාධිපති ලේකම් කාර්යාලය දැනුවත් කර ඇත.

2.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 6 කට වෙනත් වැය විෂයන්ගෙන් රු. 4,031,800 ක් ප්‍රතිපාදන මාරු කරගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 52 ත් අතර ප්‍රතිශතයක් විය. වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු නොකිරීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.	වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කල යුතුය.	ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්වී නොතිබූ වැය විෂයයන් 6 ක් සඳහා රු. 4,031,800 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ මාරු කිරීම සිදුකර ඇත.
(ආ)	සමාලෝචිත වර්ෂයේ අයවැයගත ප්‍රතිපාදනවලින් වැය විෂයයන් 11 ක සියයට 50 ට වඩා වියදම් නොවී ඉතිරි වූ ප්‍රතිපාදන වටිනාකම රු. 34,774,119 ක් විය.	වියදම් නිවැරදිව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කල යුතුය.	අපේක්ෂිත වියදම් සිදු නොවීම, රාජ්‍ය වියදම් කළමනාකරණය සහ සැලසුම් කල කාර්යයන් ඉටුකරගත නොහැකි වීම යන හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි විය.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	විගණන නිරීක්ෂණය
2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්	ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳීම් නොකල යුතුය.	2026 ජනවාරි 31 දින දක්වා බැරකම් පමණක් Cigas පද්ධතියට ඇතුලත් කිරීමට පහසුකම් සපයා දී තිබූ බැවින් හා ප්‍රතිපාදන අවසන් වී තිබූ

කරන බැඳීම් රු. 7,410,941 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA 92 ආකෘති පත්‍රය අනුව හඳුනාගත් බැඳීම් රු. 6,904,506 ක් වී තිබුණි. ඒ අනුව රු. 506,435 ක් වූ වෙනසට හේතුව සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා වියදම් දැරීමක් විය.	වැය විෂයන් සඳහා වූ බැරකම් Cigas පද්ධතියට ඇතුලත් කිරීමට පහසුකම් සපයා දී නොතිබූ බැවින්, බැරකම් ප්‍රකාශය හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර වෙනස රු. 506,435ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම " සුසැදි සුරැකි සොඳුරු බිමක නියමු " ලෙස දක්වා තිබුණු අතර මෙහෙවර ලෙස • ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් සකස් කිරීම • ශ්‍රී ලංකාවේ ඉඩම්වල ආර්ථික, සමාජීය, භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලසුම් කිරීම ප්‍රවර්ධනය සහ නියාමනය අරමුණු කරගෙන ජාතික භෞතික සැලසුම සකස් කිරීම • කලාපීය සහ ප්‍රාදේශීය භෞතික සැලසුම මගින් එම ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක සහ ජාතික භෞතික සැලසුම් ක්‍රියාවට නැංවීම • කලාපීය හෝ ප්‍රාදේශීය භෞතික සැලසුම් ඛලධරයන් විසින් අනුගමනය කිරීම සඳහා භෞතික සැලසුම් නියමු උපදෙස් සකස් කිරීම • ස්වභාවික පහසුකම් ආරක්ෂා කිරීම, ස්වභාවික පරිසරය, ගෘහ නිර්මාණය සහ ඓතිහාසික	ගැසට් මඟින් දෙපාර්තමේන්තුව පිළිතුරු ලබාදී නොමැත. වෙත පැවරී ඇති කාර්යයන් ඉටුකිරීමට වගබලා ගත යුතුය.	

වශයෙන් වැදගත් ගොඩනැගිලි සහ ස්වභාවික ලෙස වීසිතුරු ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම දක්වා තිබුණි.

2000 වර්ෂයේදී භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ඉහත දැක්ම හා අරමුණු පෙරදැරි කරගෙන පිහිටවුවද වසර 25 ක් ගතවී ඇතත් ඉහත දක්වා ඇති මෙහෙවර දෙපාර්තමේන්තුව විසින් රට වෙනුවෙන් ඉටුකර නොමැති වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ දැක්ම සාක්ෂාත් කරගත නොහැකි වී තිබුණි.

එසේ නිබියදී දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන අරමුණින් බැහැරව පූජා භූමි නඩත්තු කටයුතු හා පූජා භූමි ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි. පූජා භූමී නඩත්තුව සඳහා සහ පූජා භූමී ලෙස ප්‍රකාශ කිරීම සඳහා විශාල පිරිවැයක් හා ශ්‍රමයක් දරනු ලබන අතර මානව සම්පත් ඌනතාවයක් දෙපාර්තමේන්තුවේ පවතින අවස්ථාවක ප්‍රධාන අරමුණින් බැහැර වෙනත් කාර්යයන් වෙත සම්පත් යෙදවීමට කටයුතු කර තිබුණි.

3.2 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නිබූ අතර එය 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ක්‍රියාකාරකම්වලින්ම සමන්විත වූ අතර එම සැලසුම් බොහොමයක් සමාලෝචිත වර්ෂය තුල පවා ඉටු කර ගත	වර්ෂය තුළදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	2025 මාර්තු මාසයේදී යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම පිළිබඳව ජාතික භෞතික නිර්මාණ සභාවේ සභාපති වන අතිගරු ජනාධිපතිතුමාව දැනුවත් කරමින් ඉදිරි කටයුතු සඳහා

නොහැකි වී තිබුණි.

එතුමාගේ උපදෙස් පතන ලදී. එම උපදෙස් මත ඉදිරි කටයුතු අවසන් කළ හැකි වනු ඇත. එතෙක් ජාතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම සම්බන්ධව අවසන් කිරීමට නියමිත ක්‍රියාකාරකම්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කිරීමට සිදු වන බව දන්වා සිටිමි.

3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (269 අධිකාරිය) හා 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 7 වගන්තිය ප්‍රකාරව ජාතික භෞතික නිර්මාණ ප්‍රතිපත්තින් සකස් කිරීම සහ ජාතික භෞතික සැලැස්ම පිළියෙල කිරීම 2021 ඔක්තෝබර් 31 දින වන විට අවසන් කලයුතු වුවක්, 2019 සකස් කර තිබූ ජාතික භෞතික සැලැස්ම අවශ්‍ය සංශෝධනාක් සිදුකර ප්‍රකාශයට පත් කිරීම සෑම වසරක මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් සිදු කිරීමට සැලසුම් කර තිබූ නමුත් එම කටයුතු සැලසුම් කල පරිදි ඉටු වී නොතිබුණි.	වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින්, 2025 මාර්තු මාසයේදී යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාව,නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස ගරු අමාත්‍යතුමාව, නියෝජ්‍ය අමාත්‍යතුමාව සහ අමාත්‍යාංශ ලේකම්තුමාව ද මේ පිළිබඳව දැනුවත් කොට ඇත. බලාපොරොත්තු වන උපදෙස් ලැබුණු විට ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කිරීමට හැකිවනු ඇත.

(ආ)	අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලෝලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2025 දක්වා රු. මිලියන 1,078 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් මිලියන 19 ක් එනම් සියයට 1.7 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 09 ක් ගත වුව ද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමග ගිවිසුම්ගතවී රු. 6,788,500 ක් ගෙවා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පමණක් මේවන විට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් පිළියෙල කරමින් පැවතුණි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත තවදුරටත් ගෙවිය යුතු මුදලක් ලෙස රු. 6,726,000 ක් සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන තුල පෙන්නුම් කර තිබුණි.	අයවැයෙන් වෙන්වන ප්‍රතිපාදන උපරිම වශයෙන් අපයෝජනය කිරීමට වගබලාගත යුතු වේ.	ලෝලුගස්වැව නව නගර නිර්මාණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකරන ලද අතර, එම ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ප්‍රථම ඇතුලුනුවර පදිංචිකරුවන් සම්බන්ධයෙන් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළයුතු බවට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව, පලමුවෙන්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහනෙහි රාජකාරී සිදුකරන ලද සමාජ සම්ක්ෂණ නිලධාරීන් යොදා ගනිමින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. ඒ අනුව, ක්‍රියාත්මක සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම මෙවන විට අවසන්කර ඇත. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය කර අවශ්‍යය සංශෝධන සඳහා ඉදිරිපත් කර ඇත.
(ඇ)	2025 වර්ෂය තුලදී ද මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2025 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොනිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් , සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට	වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල ඉලක්ක අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	මධ්‍යම සහ නැගෙනහිර පළාත් කලාපීය භෞතික සැලසුම් සකස් කිරීම 2025 වර්ෂය වන විට නිමකර ඇති අතර අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය පමණක් ඉදිරියේදී සිදු කිරීමට නියමිතව ඇත. ජාතික භෞතික සැලසුම්

සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබූ අතර සැලසුම්කින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම සහ පාරිසරික ගැටළු ඇති වීමට එය හේතු වී තිබුණි. 2025 වර්ෂයේ මධ්‍යම පළාතේ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය ජනතාවට අහිමි වූ දේපළ මෙන්ම ජීවිත හානි සඳහා ද ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු තම මෙහෙවර හා කාර්යයන් නිසි ලෙස ඉටු නොවීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණද මේ වන තෙක්ම එය නිසියාකාරයෙන් ඉටුකරලීමට ප්‍රමාණවත් උත්සාහයක් දරනු ලබන බව කාර්යසාධන වාර්තා මගින්ද පිළිබිඹු වී නොතිබුණි.

දෙපාර්තමේන්තුවේ භෞතික සැලසුම් අංශයේ වෘත්තීය මට්ටමේ නිළධාරීන්ගේ හිඟකම හේතුවෙන් ඌව පලාත් කලාපීය භෞතික සැලැස්ම සකස් කිරීම ආරම්භ නොකරන ලදි.

(ඇ) පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සමාලෝචිත වර්ෂය තුල විහාර 83 ක් පූජා භූමි ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වර්ෂය තුල දී එයින් විහාර 68 ක කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

වර්ෂය තුලදී ඉටුකරගැනීමට සැලසුම් කල අයිතමයන් අදාල වර්ෂයේදීම ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙනින් මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා වසරකට වැඩි කාලයක් ගත වන අතර එම මිනින්දෝරු සැලැස්ම ලැබීමෙන් පසු භාෂාත්‍රයෙන් ගැසට් නිවේදන සකස් කරනු ලැබේ.

ඉන් අනතුරුව ඒවායෙහි නිරවද්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා නීති කොටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කරනා අතර ඒ සඳහා ද දීර්ඝ කාලයක් ගතවේ.

මෙම පියවරයන් අනුගමනය කිරීමේදී ආගමික ස්ථානයක් ගැසට් මගින් ප්‍රකාශයට පත්කිරීමේ කාර්යය සඳහා වසරකට වඩා වැඩි කාලයක් ගතවේ.

3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කොමිප්ට්‍රොලර් ජනරාල් විසින් අංක CGO/NFAMS/01/03 දරන 2024 මැයි 21 දිනැති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇමතූ ලිපිය අනුව 2024 අගෝස්තු 31 දිනට පෙර KG-9447, 57-9387, GJ-4561, LB-8983 හා 65-0690 දරන වාහන අපහරණය කළ යුතුව තිබුණද වර්ෂය අවසාන වන තෙක් එම වාහන අපහරණය නොකොට දිගින් දිගටම ඌන උපයෝජිතව පැවතුණි. අව්වට වැස්සට නිරාවරණය වෙමින් අනාරක්ෂිතව ගාල් කර ඇති මෙම වාහනවල අමතර කොටස් සොරුන් විසින් ගලවාගෙන යාමත් පාවිච්චි කළහැකි මට්ටමේ පවතින ටයර් එකතැන නවතා තිබීම හේතුවෙන් දිරාපත් වී යාමත් නිසා රජයට දැරීමට සිදුවන අලාභය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සැලකිලිමත් වී නොතිබුණි.	වක්‍රලේඛ ප්‍රකාරව වාහන අපහරණය කටයුතු කල යුතුය	මෙම වාහන අපහරණය සඳහා සේවය ලබාගැනීමට පත්කරන ලද කමිටුවේ වාර්තාව ලබා ගැනීමට අපොහොසත් වීම මත වාහන අපහරණය දිගින් දිගටම ප්‍රමාද වූ අතර, ඉන්පසු එම කමිටුවේ සාමාජිකයෙකු උසස් වීම් මත අමාත්‍යාංශය වෙත ස්ථානමාරු ලද බැවින් ඒ සඳහා නව නිලධාරියෙකු පත්කර, නැවතත් වාර්තාවක් ලබාදෙන ලෙසට දන්වා ඇත. එම වාර්තාව ලද වහාම අපහරණ ක්‍රියාවලිය සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.
(ආ)	දෙපාර්තමේන්තුව විසින් වර්ග අඩි 15,054 ක් සඳහා වූ කාර්යාල ඉඩකඩ වෙනුවෙන් වාර්ෂිකව රු. 39,328,876 ක කුලී ගෙවමින් පරිශ්‍රයක් නඩත්තු කරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීම සඳහා 2018 වසරේ සිටම කාර්යාල පරිශ්‍රය පාවිෂන් කර ඊට අදාල කාර්යාල උපකරණ වෙන්කර තබා ගෙන තිබුණි. මෙම වත්කම් මෙන්ම ප්‍රධාන කාර්යාලයේ	නිලධාරීන් බඳවා ගැනීමට දිගුකාලයකට පෙර සිටම වත්කම් සම්පාදනය කර ඌන උපයෝජිතව තබා නොගත යුතුය.	දෙපාර්තමේන්තුවේ විධායක මට්ටමේ සහකාර අධ්‍යක්ෂ නිලධාරීන් 30 දෙනෙකු බඳවා ගැනීම සඳහා වූ කාර්යයයේ සිමිත පදනමින් බඳවා ගැනීමේ කටයුතු මේ වන විටත් සිදු කෙරෙමින් පවතී. එබැවින් ඒ සඳහා වූ කාර්යාල උපකරණ හා කාර්යාල පරිශ්‍රය ඒ සඳහා සකස් කර ඇත. ජාතික භෞතික සැලැස්ම නිර්මාණය, කලාපීය භෞතික සැලැස්ම නිර්මාණය සඳහා වූ අදාල

ද්විතියික හා විධායක මට්ටමේ නිලධාරීන් 71 දෙනෙකුගෙන් සමන්විත මුළු කාර්ය මණ්ඩලය 85 දෙනෙකුට අවශ්‍ය ප්‍රමාණයට වඩා කාර්යාල උපකරණ, පරිගණක උපාංග මුළු පරිශ්‍රයෙන් 1/3 ක් පමණ වූ ඉඩකඩ ද ඌන උපයෝජිතව පවත්වා ගෙන ගොස් තිබුණි. මීට අමතරව සමාලෝචිත වර්ෂයේදී ද රු. 1,957,071ක් වියදමක් දරමින් පර්යේෂණ කාර්යාලයක් (Research room) ඉදිකර තිබුණද ඒ සඳහා අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවාගැනීමට මෙවැනි තෙක්ම කටයුතු කර නොතිබුණි.

කටයුතු සිදු කිරීම සඳහා මෙන්ම ඒ සඳහා අවශ්‍ය වන්නාවූ පර්යේෂණ හා දත්ත රැස් කිරීම මෙන්ම එම කාර්යයන් පහසු කිරීමට පර්යේෂණ කාර්යාලයක් දෙපාර්තමේන්තුව තුල ඉදිකර ඇත. තවද ඒ සඳහා වූ කාර්යයන් ඉටුකිරීම සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ) නිලධාරින් විසින් සිදු කල යුතු වුවද එම බඳවා ගැනීම සිදු කරන තෙක් ඒ සඳහා සුදුසුකම්ලත් පළපුරුදු භෞතික සැලසුම් ශිල්පින් හා සංවර්ධන නිලධාරින් විසින් එම කාර්යය මේ වන විටත් සිදු කරමින් පවති.

(ඇ) මහියංගණය සංචාරක බංගලාව පවතින භූමියේ දෙපාර්තමේන්තුවට අයත් යැයි සැලකෙන එහෙත් දෙපාර්තමේන්තුව විසින් භාවිතයට නොගන්නා ඌන උපයෝජිත ගොඩනැගිල්ලක් පැවතුනි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ මහියංගණය නිවාඩු නිකේතනය වටා වැටක් ඉදිකිරීම සඳහා රු. 2,568,165 ක් වැය කර ඇතත් එම සංචාරක බංගලාව සහ ව්‍යාපෘති කාර්යාලය පිහිටි භූමිය සහ ගොඩනැගිලිවල හිමිකම සම්බන්ධයෙන් නීතිමය ගැටළු පවතින අතර වන අලි ගැවසෙන ප්‍රදේශයක් වීම හේතුවෙන් නිවාඩු නිකේතනයද භාවිතයට නුසුදුසු තත්වයේ පැවතුණි. අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදන වර්ෂය තුළ ඉතිරිවීම හේතුකරගෙන අදාළ ඉදිකිරීම් සිදුකර තිබුණත් මනා සැලසුම් කිරීමකින් තොරව සිදුකර ඇති මෙවැනි ඉදිකිරීම් ඵලදායී වී නොතිබුණි.

සංවර්ධන කටයුතු කිරීමට පෙර වත්කම් නිසි පරිදි දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටත් රජයේ වියදමින් ඉදිකරන ලද ගොඩනැගිලි උපරිම ආකාරයෙන් භාවිතයට ගත හැකි ආකාරයට කටයුතු සැලසීමද කල යුතුය.

අදාල හිමිකම් ඔප්පු මෙම දෙපාර්තමේන්තුව වෙත ලබාදීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලය විසින් කටයුතු කරමින් පවතී.
දෙපාර්තමේන්තු නිළධාරීන් ඌව පළාත ඇතුළු ආසන්න පළාත් වල රාජකාරී කටයුතු සිදුකිරීමේදී නවාතැන් ගැනීම සඳහා පවතින එකම ස්ථානය මෙම සංචාරක බංගලාව පමණි.

(ඇ)	දෙපාර්තමේන්තුව භාවිතයේ පවතින අංක 65-0690 දරන වාහනය මුදල් අමාත්‍යාංශයට අයත් වාහනයක් වන අතර එම වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	මේවන තෙක්ම පවරාගෙන නොමැති මෙම වාහනය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමටත් නිවැරදි ආකාරයට ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය.	65-0690 දරන වාහනය මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු සිදු කර ඇත.
(ඉ)	ආයතනය සතුව වාහන 14 ක් පවතින අතර වර්ෂය තුළ එම වාහන අලුත්වැඩියාව සඳහා රු.6,623,044 ක වියදමක් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි. නමුත් මේ වන විට දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා ධාවන තත්වයේ පවතින්නේ වාහන 06 ක් පමණක් වන අතර ඉතිරි වාහන අලුත්වැඩියාවන් සිදුකිරීමට කටයුතු සිදුනොකර කොළඹින් පිට රාජකාරී ගමන් සඳහා අමාත්‍යාංශ වාහන ඉල්ලුම් කර තිබුණු අවස්ථා පැවතුණි.	රජයේ වාහන නිසි පරිදි අළුත්වැඩියා හා නඩත්තු කර පවත්වා ගැනීමට කටයුතු කළ යුතුයි.	දෙපාර්තමේන්තුව සතුව පවතින වාහන 14 අතුරින් ධාවන කටයුතු සඳහා සුදුසු තත්ත්වයේ පවතිනුයේ වාහන 09 ක් පමණක් වන අතර, ඉතිරි වාහන 05 ගර්හිත තත්ත්වයේ පවතී. එම වාහන 09 අතුරින් අලුත්වැඩියා කරන ලද වාහන නිරන්තරයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා ධාවනයට යොමු කරයි. ඒ අතරතුර ඇති වන දෝෂයන් සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය මත අලුත්වැඩියාව සඳහා යොමු කරයි. ඇතැම් අවස්ථාවන්හිදී සියලු වාහන අලුත්වැඩියා තත්ත්වයේ ද පවතිනු ඇත. එවන් අවස්ථාවලදී හා දුර බැහැර රාජකාරි සඳහා යැමට වන අවස්ථාවලදී අවශ්‍ය අමාත්‍යාංශයේ වාහන ඉල්ලුම් කර ඇත.

3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම පිළිබඳ විස්තරය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයේ විගනණයට අනුකූලව නිකුත් කරන ලද විගණන විමසුම් සඳහා දෙපාර්තමේන්තුව විසින් නියමිත කාල පරාසය තුළ පිළිතුරු ලබා දී නොතිබුණු	විගණන විමසුම්වලට නියමිත කාලය තුළදී පිලිතුරු ලබාදිය යුතුය.	2025 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇතත්, සමහර විගණන විමසුම් ලැබී ඒවාට පිළිතුරු දින කිහිපයක් ඇතුළත ලබා දී ඇත.

අතර ඒවාට පිළිතුරු ලබා ගැනීමට මාස 1-3 අතර කාලයක් ගතවී තිබුණි.

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 02/2017 චක්‍රලේඛය ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්යභාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීම යන තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධීකරණය කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව නිමැවුම් දර්ශක හඳුනා ගැනීම, ප්‍රධාන කාර්ය දර්ශකය ප්‍රකාශයට පත් කිරීම, ආයතනයේ කාර්යභාරය හා සබැඳි පාර්ශව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුයි.	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ තිරසාර සංවර්ධන අරමුණු හා තිරසාර නිමැවුම් දර්ශක හඳුනාගෙන ඇති අතර, එම අරමුණු සබැඳි සමහර පාර්ශව හඳුනාගෙන දැනුවත් කිරීම් කර ඇති අතර, සමහර සබැඳි පාර්ශව හඳුනා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිලියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව සිදුකළ යුතු අතර මේ සඳහා රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි නොමැති අතර ජාතික/ භෞතික සැලසුම් ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය	විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්‍රමාණවත් පරිදි බඳවාගෙන ජාතික භෞතික සැලසුම් ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.

ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරන නගර නිර්මාණ පනත මඟින් සංශෝධනය කර තිබූ නමුත් අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගනිමින් තම මෙහෙවර ඉටුකිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.

(ආ)	2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 286 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 128 ක් වූයෙන් පුරප්පාඩු 158 ක් විය. මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපා තිබුණි.	පුරප්පාඩු පුරවා නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය	සහකාර අධ්‍යක්ෂ (නගර නිර්මාණ) III ශ්‍රේණියේ තනතුරෙහි පවත්නා පුරප්පාඩු 12 ක් පිරවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇත. අධ්‍යක්ෂ තනතුරු 04 සඳහා නිර්දේශ ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂම වෙනින් නිර්දේශ ඉල්ලා ඇත. ඒකාබද්ධ සේවා නිලධාරීන්ගේ පවතින පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. බඳවා ගැනීම් සම්බන්ධ ඉදිරි කටයුතු කඩිනමින් සිදු කිරීමට බලාපොරොත්තුවෙමි.
(ඇ)	ඉහත තොරතුරු අනුව විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා විශාල පුරප්පාඩු සංඛ්‍යාවක්, එනම් විධායක ශ්‍රේණියේ අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 80ක් ද, තෘතියික තනතුරු සංඛ්‍යාවෙන් සියයට 75 ක් සහ ද්විතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු පිළිවෙළින් සියයට 55 ක් හා සියයට 42 ක් ලෙස පුරප්පාඩුව පැවතුණු අතර දෙපාර්තමේන්තුවේ සමස්ථ තනතුරු සංඛ්‍යාවෙන් සියයට 55 කට වඩා පුරප්පාඩුව පවතින් බව නිරීක්ෂණය වේ.	පුරප්පාඩු පුරවා නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය	දෙපාර්තමේන්තු ගත තනතුරු වරින් වර බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු ආරම්භ කර තිබුණද, විවිධ හේතූන් මත එම බඳවා ගැනීම් අතරමග නතරව තිබූ බැවින් දිගින් දිගටම මෙම බඳවා ගැනීම් සිදු කිරීම වැළකී ගොස් තිබුණි. සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) පුරප්පාඩු 02 හා ප්‍රධාන ගණකාධිකාරි ධුරය මේ වන විට සම්පූර්ණ කර ඇත.

(ඇ)	එමෙන්ම දෙපාර්තමේන්තුවේ තීරණ ගැනීමේ හා තීරණ ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා සෘජුවම දායකත්වයක් සපයන ඉහළ කළමනාකරණ මට්ටමේ (විධායක හා තෘතියික) තනතුරු කිහිපයක්ම දීර්ඝ කාලීනව පුරප්පාඩුව පැවතුණි.	පුරප්පාඩු පුරවා නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය.	මේ වන විට මෙම බඳවා ගැනීම් සම්බන්ධව කටයුතු සිදු කරමින් පවතින අතර, සහකාර අධ්‍යක්ෂ බඳවා ගැනීම මේ වන විටත් අවසන් අදියරේහි සිදු කරමින් පවති. දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවා ගැනීම් මගින් පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කර ඇත. ඒ අනුව සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) පුරප්පාඩු 02 හා ප්‍රධාන ගණකාධිකාරි ධුරය මේ වන විට සම්පූර්ණ කර ඇත.
(ඉ)	ඉහත දක්වා ඇති තනතුරුවල එක් එක් තනතුරට අදාළව එක් පුරප්පාඩුවක් හෝ සම්පූර්ණ නොවී සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවම වසර 15 ක පමණ කාලයක් තිස්සේ පුරප්පාඩුව තිබූ බවට නිරීක්ෂණය වූ අතර ඒ අනුව දීර්ඝ කාලයක් තිස්සේ ඉහළ කළමනාකරණ තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇති බවත් අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාවවත් කඩිනමින් පිරවීමට කටයුතු කර නොතිබුණි.	පුරප්පාඩු පුරවා නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් කළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.

එස්.සංජීව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුවේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
1. යාවත්කාලීන කරන ලද ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය	√		
2. සකස් කරන ලද කලාපීය සැලසුම්	√		
4. ගැසට්කරන ලදපූජාභූමි			√
6.පූජා භූමි සඳහා තාක්ෂණික උපදේශනය ලබාදීම	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0% -49%	50%- 74%	75% - 100%
2030 වන විට, සියලු රටවල සහභාගීත්ව, ඒකාබද්ධ සහ තිරසාර මානව ජනාවාස සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා අන්තර්ගත සහ තිරසාර නාගරීකරණය සහ ධාරිතාව වැඩි දියුණු කිරීම	**ජනගහන වර්ධන අනුපාතයට ඉඩම් පරිභෝජන අනුපාතය**	**√**		
ජාතික හා කලාපීය සංවර්ධන සැලසුම්කරණය ශක්තිමත් කිරීම මගින් නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශයන්හි සම්බන්ධතාවන් සඳහා සහාය වීම	කලාපීය හා ප්‍රාදේශීය සංවර්ධනය සඳහා සකස් කරනු ලැබ ඇති සැලසුම් ගණන	**√**		

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් සකස් කරන ලද **තිරසර**පරමාර්ථ අතරින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ වන පරමාර්ථය වන්නේ 11 වන පරමාර්ථය වන අංග සම්පූර්ණ ආරක්ෂක, ශක්තිමත් සහ තිරසාර නගර ඇතිකිරීම. එම අරමුණ ළඟා කර ගැනීම සඳහා ඉහත සඳහන් ඉලක්ක හා දර්ශක හඳුනා ගෙන ඇත. එම ඉලක්කවලට ළඟා වීම සඳහා කලාපීය සහ ප්‍රාදේශීය සැලසුම් සකස් කළ යුතුව ඇත.මෙම වාර්තාවේ 2 පරිච්ඡේදයේ 2025 වසරේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට පැවතිඅභියෝග යටතේ දක්වා ඇති පරිදි ප්‍රධානතම අභියෝගය වූයේ සැලසුම්කරණයටඅදාලව පවතින තනතුරුපුරප්පාඩුව පැවතීමය.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	51	12	39
තෘතීයික	08	02	06
ද්විතීයික	114	52	62
ප්‍රාථමික	113	61	52
එකතුව	286	127	159

06.2 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)දේශීය	වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
Short course on Introduction to Urban Informatics and Planning Techniques	24	මාසයකි	450,000.00	දේශීය	Urban Informatics and Planning Techniques
Sketchup and Lumion Course	01	එක් දිනකි	25000.00	දේශීය	
නිවාඩු හාර නිලධාරියාගේ කාර්යභාරය හා වගකීම	02	එක් දිනකි	13,000.00	දේශීය	
රජයේ වාහන නඩත්තුව	01	එක් දිනකි	6,500.00	දේශීය	
හානි පාඩු හා මු.රෙ 104 යටතේ වූ පරීක්ෂණය	02	එක් දිනකි	13,000.00	දේශීය	
කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි	03	දින දෙකකි	36,000.00	දේශීය	
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම	05	එක් දිනකි	32,500.00	දේශීය	
Certificate Program in ICT & AI for Office Productivity	02	දින පහක්	60,000.00	දේශීය	
විනය කාර්ය පටිපාටිය සහතික පත්‍ර පාඨමාලාව	02	දින දහයක්	50,000.00	දේශීය	
ලිපිගොනුකරණය	01	එක් දිනකි	6,500.00	දේශීය	
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	01	එක් දිනකි	14,000.00	දේශීය	

07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ	අනුකූලවේ		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**	අනුකූලවේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල	අනුකූල වේ		

	පවරා දී තිබීම			
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම			
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/12019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	විගණන විමසුම සඳහා මසක් ඇතුලත පිළිතුරු නොලැබෙන අවස්ථා ඇත.	
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	නියමිත දිනට ඉදිරිපත් කර ඇත.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	සිදු කරමින් පවතී.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	සිදු කරමින් පවතී.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	කමිටු වාර්තාව ලැබී නොමැත	ඉදිරියේදී මෙම කටයුතු අවසන් කළ හැක
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1	අනුකූල වේ		

	ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.			
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූලවේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියටරැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූලවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	නිහතිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		

14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම			
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.			
18.2	එම චක්‍රලේඛයේ2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු			

	අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම	අනුකූල වේ		
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම	අනුකූල වේ		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		